# ගොවීන්ගේ කතා පුවත්

සාමාන්‍ය ගොවියෙකුට ඉඩම් කොපමණ තිබේද? ගොවි කටයුතු කරගෙන යාමේදී මුහුණ දෙන ප්‍රශ්න මොනවාද? ගම්වල ඇති නොයෙකුත් ආයතන වැඩ කරන්නේ කෙසේද? ගොවිතැන සෑහීමකට පත්විය හැකි වෘත්තියක් ද? අනුරාධපුරයේදී, වවුනියාවේදී හා මහනුවරදී අපට මුණ ගැසුනු ගොවීන් 10 දෙනෙකුගෙන් අප ඇසූ සමහර ප්‍රශ්න මේවායි. මේ ගොවීන් 10 දෙනාගෙන් එක් අයෙක් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයේ ගොවිපලක කළමනාකරුවෙක් විය.

ඔවුන් අප සමඟ කී කථා පුවත ඉතාමත් කෙටියෙන් මෙහි පහතින් වාර්තා කරනු ලැබේ.

මහඉලුප්පල්ලම කැලේඳුල් වැවේ කේ.එම්.ටී. බණ්ඩා මහතාගේ ගොවිපල ප්‍රධාන වාරිමාර්ග ක්‍රමයක් යටතේ වැඩ කෙරේ. බණ්ඩා මහතාගේ ජයග්‍රහණය පිළිබඳ සාර්ථක කථා පුවත අනුරාධපුරයේ සිටින අනිකුත් සියළුම ගොවීන්ගේත් කථා පුවත යයි කියන්නට අපට පුළුවන් නම් එය කෙතරම් වාසනාවන්තද?

එල්.ඩී.ඕ. බිම් කට්ටියක් හැටියට ලැබුණු ගොඩ ඉඩම් අක්කර 5 ක සහ මඩ ඉඩම් අක්කර 2 ක 1968 දී ගොවිතැන ආරම්භ කළ බණ්ඩා මහතාගේ දැන් වයස අවුරුදු 30 කි. ගොවිතැන ආරම්භ කිරීමට මුලින් ඔහු රු. 100/ක් යෙදවූ අතර, පටන් ගැනීම එතරම් ලෙහෙසි පහසු වුනේ නැත. කොහොම වුනත් ඉතාමත් හොඳින් වැඩ කළ බණ්ඩා මහතා ඊළඟ අවුරුද්දේදී වී වලින් සහ ගොඩ ඉඩම්වල බෝගවලින් රු. 3000/ක විතර ආදායමක් ලබා ගත්තා.

ඔහුගේ ජයග්‍රහණය පිළිබඳ කථා පුවත දෙයාකාරයි. වාසනාවකට වාගේ ඔහුගේ ඉඩමට වතුර ලැබුනේ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයකින්. ඒ නිසා වතුර ඔහුට එතරම් ප්‍රශ්නයක් වුනේ නැහැ. දෙවනුව යල කන්නයේ දී අනෙක් අය කරන්නා වාගේ බණ්ඩා මහතා වී වගා කළේ නැහැ. චාරිත්‍රානුකූල සිරිත් විරිත් අහක් කර දමා බණ්ඩා මහතා යල කන්නයේ වී වගා කරනවා වෙනුවට එළවළු තවත් බෝග ජාතිත්, මිරිසුත් වගා කළා. ඔහු කුකුළන් ද ඇති කළා. ගොඩ ඉඩම්වල එක් අක්කරයකින් ඔහුට වී බුසල් 45 ක් ලැබුණු අතර, මඩ ඉඩම් අක්කර 2½ කින් වී බුසල් 160 ක් ලැබුණා. වී අක්කරයක් වගා කරන්න ඔහුට රුපියල් 250/ ක් පමණ වියදම් වුන බව ඔහු අප සමඟ පැවසුවා. මේ ට්‍රැක්ටර් ගාස්තු අත් හැරලයි.

මේ විදියට ගොවිතැන ආරම්භ කරල අවුරුද්දක් විතර ගත වෙන කොට ඔහුට පුළුවන් වුනා රු. 2500/-කට වතුර පොම්පයක් මිළයට ගන්නට. ඊටත් අවුරුද්දකට පස්සේ රු. 4600/ක් වටිනා රෝද දෙකේ ට්‍රැක්ටරයක් බණ්ඩා මහතා මිළදී ගත්තා. ඇත්තෙන්ම කියනවා නම් ඔහු සාර්ථක විදියට ජීවිකාව කරගෙන ගිහින් තිබෙනවා. ඔහුට ගුවන් විදුලි යන්ත්‍රයක් සහ බයිසිකලයකුත් තිබෙන අතර, ගොවිතැනින් ජීවිකාව සරු කර ගත් කෙනෙක් හැටියට ඔහු පිළි ගන්නවා.



අවුරුදු තුනක් ගොවිතැන් කර ලැබුන ලාබයෙන් කේ. එම්. ටී. බණ්ඩා මහතා මිළයට ගත් රෝද දෙකේ ට්‍රැක්ටරය.

බීජ වී, පෝර හෝ කෘෂි රසායනික ද්‍රව්‍ය ලබා ගැනීම බණ්ඩා මහතාට එතරම් අමාරු කාරණයක් නොමෙයි. ඔහුට ණය මුදල් උවමනා නැහැ. ඔහු තමාගේ වී ළඟම තිබෙන සමුපකාරයට විකුණනවා. පුද්ගලික වෙළෙන්දෝ ඔහුගේ එළවළු සහ මිරිස් ලබා ගැනීමට පැමිණෙනවා.

බණ්ඩා මහතා මහ ඉලුප්පලම ගොවි පලේ ටික කලක පුහුණුවක් ලැබූ බව ඔහු අප සමඟ ප්‍රකාශ කළා. ඔහුගේ ජීවිතයේ වැදගත් දෙයක් හැටියට ඔහු ගොවිතැන සළකනවා. බණ්ඩා මහතා නොකඩවාම ගොවිකම් සඟරාව කියවනවා. ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ ගොවි වැඩ සටහන් වලට ද කන් දෙනවා. ගොවිතැනින් සෑහීමකට පත්ව සිටින ඔහු රජයේ සේවයේ රු. 500/-ක වැටුපක් ලැබෙන තනතුරකටවත් ගොවිතැන් අත් හරින්ට කැමති නැහැ.

තමාගේ කථාන්තරය අවසන් කරමින් බණ්ඩා මහතා අප සමඟ කීවේ ඒ ප්‍රදේශයේ ගොවි ජීවිතයේ ලොකුම ප්‍රශ්නය වතුර ප්‍රශ්නය බවයි. ඒ වුනත් ඒ අතින් නම් බණ්ඩා මහතා හරිම වාසනාවන්තයි. ඔහුගේ ගොවිපලේ නොයෙකුත් වර්ගයේ එළවළු ජාතිවලින් ඔහුට සරු ආදායමක් ලැබුනා. විශේෂයෙන්ම මිරිස් වලින් හොඳ මුදලක් ලබා ගන්නට බණ්ඩා මහතාට පුළුවන් වෙලා තිබෙනවා. හාල් සලාකය අඩු කිරීම ගැන බණ්ඩා මහතාගේ එතරම් තැකීමක් නැහැ. දෙන සේරු $\frac{1}{2}$ය නැතුව වුනත් ඉන්න ඔහු සූදානම්. ඒත් ඔහුගේ ප්‍රදේශයේ අනිකුත් ගොවීන්ගේ තත්වය මෙහෙම නොවෙයි. ඊළඟ මාස කිහිපයේ ඇති වන අමාරුකම් විඳ දරා ගන්ට සාමාන්‍ය ගොවියන්ට පුළුවන් නම් සහල් සලාකය අඩු කිරීම නිෂ්පාදන වැඩ කටයුතු හුඟක් වැඩි කිරීමට පෙළඹීමක් බව බණ්ඩා මහතාගේ හැඟීමයි.

කොහොම වුනත් බණ්ඩා මහතා කියන විදියට ගොවි කාරක සභාව නම් හොඳින් වැඩ කරන්නේ නැහැ. ගොවීන් වැඩි දෙනෙක් ඔවුන්ට අයිති වැඩ කොටස හොඳින් ඉටු කළත්, ගොවි කාරක සභාව උදාසීන බව බණ්ඩා මහතා කෙළින්ම කීමට කැමති වුනා. ගොවි කාරක සභාව හදන්න තිබ්බ වෙල්ලක් තවම හද නොමැති බව බණ්ඩා මහතා ප්‍රකාශ කළා.

කෘෂිසේවා මධ්‍යස්ථානය පිළිබඳව ඔහු අසා තිබෙනවා. අසනීපයෙන් පෙලුන නිසා ඔහුට එහි යාමට බැරි වුනා. ඒ මධ්‍යස්ථානයේ ලංකා බැංකු ශාඛාවෙහි තමාගේ ඉතිරි කිරීම් තැන්පත් කිරීමට බණ්ඩා මහතා අදහස් කරනවා.


ට්‍රැක්ටරයට වියදම් වුන මුදල හැරෙන්නට වී බුසලකට ඔහුට සාමාන්‍යයෙන් වියදම් වුනේ රු. 10/-ක් විතර ගණනක්. ඒත් කම්කරුවන් ලවා වැඩ කරවන අනිකුත් ගොවීන්ට නම් මේ මුදල මීට ටිකක් වැඩි වන්නට පුළුවන්. වී බුසලක මිළ රු. 25/-කට වැඩි කිරීම ඇත්තෙන්ම ඉතාමත් හොඳ දෙයක්.

× × × ×

එප්පාවල නල්ලමුදුවේ බී. ඩිංගිරි බණ්ඩා මහතා ගොවිතැන් කළේ සුළු වාරිමාර්ග ක්‍රමයකින්. බණ්ඩා මහතා පැවසූ අන්දමට ගොවීන් 10 දෙනෙකුගෙන් 9 දෙනෙකුටම තිබෙන ප්‍රශ්නය වතුර පිළිබඳ ප්‍රශ්නයයි. ඇත්තෙන්ම අනුරාධපුරයේ සෑම ගොවියෙකුගේම ආයාචනය වුනේ වැස්ස නැත්නම් වතුර ලබා දෙන්න කියලයි.

ඩිංගිරි බණ්ඩා මහතාගේ වයස අවුරුදු 25යි. ඔහු තවම අවිවාහකයි. ඩිංගිරි බණ්ඩා මහතා ගොවිතැන් පටන් ගත්තේ වයස අවුරුදු 15 දී. මඩ ඉඩම් අක්කර 4 ක වී සහ ගොඩ ඉඩම් අක්කර $1\frac{1}{2}$ ක් ඔහු වගා කරනවා. ඔහුගේ සාමාන්‍ය අස්වැන්න අක්කර එකකට බුසල් 40 යි. ඩිංගිරි බණ්ඩා මහතා, හේන්වල කුරක්කන්, ඉරිඟු, මිරිස් හා ලූණු වවලා තියෙනවා.


පෝර ගන්නට තරම් වත්කමක් නැති නිසා ඔහු පෝර යොදන්නේ නැහැ. යල කන්නයේදී නල්ලමුදුව වැව නිතරම හිඳී යන නිසා යල කන්නය ඒ පලාතේ ගොවියන්ට හොඳ කන්නයක් නොවේ. මඩ ඉඩම් අක්කරයක



පුරාණ ඇළ අළුත්වැඩියා කළහොත් කන්න දෙකටම ඇති තරම් වතුර ලැබෙන බව පවසන බී. ඩිංගිරි බණ්ඩා මහතා සහ බී. පුංචිබණ්ඩා මහතා.

වී වගා කිරීමට වැය වන මුදල රු. 400 ටත් 500 ටත් අතර වෙනවා. මේ ගණනට අත්තන් කුලිය අයිති වෙලා නැහැ. වතුර හිඟකම නිසා මුළු අක්කර ප්‍රමාණයම වගා කරන්නේ නැතුව සැරෙන් සැරේ බෝග වගා කරනවා. වී සමුපකාර සමිතිවලට විකුණන අතර, පෞද්ගලික වෙළෙන්දෝ අනෙක් බෝග මිළදී ගන්නවා.

වෙලි අළුත්වැඩියා කිරීම ගැන ගොවි කාරක සභාව හොයා බලන අතර ඇලවල් ශුද්ධ කිරීමට ඒ කාරක සභාව දින නියම කරනවා. ඩිංගිරි බණ්ඩා මහතා පැවසූ අන්දමට ඒ පළාතේ ගොවි කාරක සභාව හොඳින් වැඩ කළත් ලොකුම ප්‍රශ්නය වෙලා තියෙන්නේ වතුරයි. මේ ප්‍රශ්නය නිසා සාමාන්‍ය ගොවියාට වැඩි දියුණුවක් ඇති කර ගන්නට පුළුවන් කමක් නැහැ. මේ ළඟදී මාවතගම සහ කැලේගම වැව් දෙක එකට සම්බන්ධ කරලා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වේල්ලක් හැදූව නිසා මේ ගම් දෙකේ ගොවියන්ට ඇති තරම් වතුර තිබෙනවා. ඔවුන්ගේ බෝග හුඟාක් වැඩි වුනා.



අවුරුදු 75 ක් වයස පී. මුදලිහාමි මහතාගේ ආයාවනය වූයේ වැස්ස සහ වතුර සඳහාය.

වී මිළ වැඩි කිරීම නම් හොඳ දෙයක්. ඒත් වතුර නැති නිසා කන්න කිහිපයකදීම තමන්ගේ බෝග වගා කර ගන්න බැරි වුන හේතුවෙන් හාල් සලාකය අඩු කිරීම ඒ අයට සෑහෙන ප්‍රශ්නයක්. වතුර පිළිබඳ තත්වය දියුණු කරන තුරු තමන් කොච්චර උත්සාහ කළත් වැඩි දියුණුවක් ඇති කර ගන්නට බැරි බව ඩිංගිරි බණ්ඩා මහතාගේ අදහසයි. ඒ වුනත් වී බුසලකට රු. 25/-ක් ගෙවීම ඇත්තෙන්ම ගොවියන්ට ආශිර්වාදයක්.

නැවත නැවතත් වතුර ප්‍රශ්නය ගැන කථා කිරීමට සිදුවීම ගැන කණගාටුව ප්‍රකාශ කළ ඩිංගිරි බණ්ඩා මහතා පැවසුවේ මේ ප්‍රශ්නය විසඳුවොත් මොන විදියකවත් ආධාරයක් අවශ්‍ය නැති බවයි. එහෙම නම් දූන් දෙන හාල් සේරු $\frac{1}{2}$ ය නතර කළත් කමක් නැහැ. යෝධ වැව හරහා කලා වැවේ සිට තිසා වැවට එන ඇළක් තමන්ගේ ගමේ තිබෙන බව ඔහු කීවා. මේ ඇළ අලුත්වැඩියා කළොත් ඔවුන් සෑම දෙනාටම ඇති තරම් වතුර ලබා ගන්න පුළුවන්.


ඒ ගමේම වාසය කරන පුංචි බණ්ඩා මහතා අවුරුදු 33 ක් වයස ගොවියෙක්. ඔහු අසළ පාසැලක ගුරුවරයෙක්. ගොවි පරපුර ගැන ඔහු ලොකු සැළකිල්ලක් දක්වනවා. මාවතගම ජනතාවට ඉතාමත් අවශ්‍ය වතුර ලැබෙන පරිදි අලුත්වැඩියා කරන ලද පෝෂිත වැව නම් අලුත් ඇලක් පිළිබඳව ඔහු සඳහන් කළා.

× × × ×

වවුනියාවේ චෙට්ටිකුලම්හි කුඩිඉරිප්පුවේ ජේ. අරුලප්පු මහතා සුළු වාරිමාර්ග මෙන්ම ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ ගොවිතැන් කරනවා. අරුලප්පු මහතා මුළු ජීවිත කාලය තුළම ගොවියෙක්. ඔහුට කුඹුරු අක්කර 7 කුයි. ගොඩ ඉඩම් අක්කර 5 කුයි තිබෙනවා. කුඹුරු අක්කර හතෙන් 4 කට ප්‍රධාන මාරිවාර්ග ක්‍රම යටතේ වතුර ලැබෙන අතර, අක්කර 3 කට සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වතුර ලබෙනවා. ලොකුම ප්‍රශ්නයක් හැටියට ඔහු අවධාරනයෙන්ම සඳහන් කළේ වතුර ගැනයි. වට පිට බැලුවොත් ඔක්කොම වැව් හිඳිලා තිබෙන බව පේනව නේද යනුවෙන් ඔහු ප්‍රකාශ කළා.

ඔහුට ප්‍රධාන ආදයම ලැබෙන්නේ වී වලින්. මහ කන්නයේදී අක්කර හතෙන් වී බුසල් 350ක් විතර ඔහුට ලැබුනා. පසුගිය යල කන්නයේදී මඩ ඉඩම් අක්කර $1\frac{1}{2}$ ක් වගා කිරීමට පමණයි පුළුවන් වුනේ. මෙයින් ඔහුට වී බුසල් 60 ක් ලැබුණා.

ගොවි කාරක සභාව සාමාන්‍යයෙන් හොඳින් වැඩ කරන බවයි ඔහු අදහස් කළේ.



ගොඩ ඉඩමට වතුර ලැබෙන තම ළිඳ අසල ජේ. අරුලප්පු මහතා.

ඔහු එහෙම කිව්වේ ටික කලක් ගොවි කාරක සභාවේ ලේකම් හැටියට කටයුතු කළ නිසාම නෙමෙයි. යල කන්නයේදී සීමාසහිත අක්කර ගණනක් පමණක් වගා කිරීමට ඉඩ දීමට ගොවි කාරක සභාවලට සිදු වෙලා තියෙනවා. එහෙම කරන්නේ වතුර හැකිතාක් දුරට අනිකුත් ගොවීන්ට ද ලබා ගැනීමට පුළුවන් වෙන්නටයි.

ඔවුන්ගේ ගොවි කටයුතු දියුණු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හුඟක් වැඩ කළ හැකියි. කාන්ගන්කුලම්, පට්ටකාටුකුලම් සහ සන්දරඋඩයාර්කුලම් යන වැව්වල අඩුපාඩු වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සොයා බලා නැහැ. මෙම වැව්වල වේලි කැඩිලා. ඒවා අලුත්වැඩියා කළොත් අක්කර 150 කට විතර වතුර ලබා ගන්න පුළුවන්. වාරියසේන කුලම්. පෙරියඒක්කන්කුලම් සහ කරම්බයිකුලම් යන වැව් තුනේ වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනවා.

ණය මුදල් පිළිබඳ තත්වය නම් අසතුටුදායකයි. මේ කාලය කුඹුරු හාන කාලය වුනත් (ඔක්තෝබර් 8) තවමත් ණය මුදල් ලැබී නැහැ. මුලින් අරුලප්පු මහතා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් ලබාගෙන ඇති බව ඔහු පැහැදිලි කළා. ඊට පස්සේ 1965 දී සහ 1966 දී මහජන බැංකුවෙන් ඔහු ණය මුදල් ලබාගෙන තිබෙනවා. මේ ණය මුදල් දූන් ගෙවා අවසානයි. එහෙත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් මුලින් ලබා ගත්ත ණය මුදලින් තව ගණනක් ගෙවීමට ඉතිරිව තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුවෙන් තවත් ණයක් ලබා ගන්න නම් මේ මුදල ඔක්කොම පියවන්න ඕනෑ. ඉතිරි මුදල ගෙවීම නම් ඔහුට ප්‍රශ්නයක් නෙමෙයි. එහෙත් එකතු වෙලා තිබෙන පොලිය ලොකු ගණනක්. මේ තත්වයේ ඉන්න තවත් ගොවීන් බොහෝ දෙනෙක් සිටින බව ඔහු අපට කීවා.

ණය මුදල පිළිබඳ ප්‍රශ්නය ගැන තවත් කරුණු පැහැදිලි කළ අරුලප්පු මහතා කීවේ සාමාන්‍යයෙන් සමුපකාර සමිතිවලින් ලබා දෙන ණය මුදල් ඔවුන්ගේ ගොවිපලවල් වල සියළුම වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන බවයි. ඕනෑකම නිසාම මුදල් ණයට දෙන අයගේ ආධාරය බලාපොරොත්තු වීමට ඔවුන්ට සිදු වෙනවා. ණය මුදල් ආපහු ගෙවීමේ කාලය පැමුණුනාම ණය හිමියා වරද්දන්නේ නැතිව මුදල් ලබා ගන්න පැමිණෙනවා. ඒ මුදල් ගෙව්වාට පස්සේ ආණ්ඩුවේ ණය මුදල් ගෙවන්න මුදලක් ඉතිරි වන්නේ නැහැ. සමුපකාර වලින් දෙන ණය මුදල් ආපහු ලබා ගැනීමට හොඳ වැඩ පිළිවෙලකුත් සමුපකාරවල නැහැ. මේ ණය මුදල් දීම හොඳින් පරීක්ෂා කෙරුවොත්, ඒ වගේම ණය දෙන ආයතන ටිකක් උනන්දුවෙන් වැඩ කළොත් ලබා ගැනීමට ඇති මුදල ආපසු අයකර ගන්නට පුළුවන්.

ණය බරින් මිරිකීමට තවත් හේතුවක් වන්නේ ඇතැම්විට ඉඩම අයිතිකරු තම ඉඩම බැඳ ණය මුදලක් ලබාගෙන ඒ ඉඩම වෙනත් කෙනෙකුට බදු දීමයි. එහෙම වුනාම බදු කරුට ණය මුදලක් ගන්න බැරි වෙනවා. මේ හේතුවෙන් ගොවිතැන් හොඳින් කෙරෙන්නේ නැහැ.

අරුලප්පු මහතා කීවේ වී අක්කරයක් වැඩ කිරීමට රු. 700/-ක් පමණ වියදම් වන බවයි. ගොවිතැන් කිරීමෙන් අවුරුද්දකට රු. 4700/-ක පමණ ශුද්ධ ලාභයක් ලබා ගැනීමට ඔහුට පුළුවන් වුනා.

× × × ×

වෙට්ටිකුලම්හි කුඩිඉරිප්පුවේ පී. බස්තියන් පිල්ලේ මහතාගේ පුතා වූ ටී. දේවදසන් මහතා අවුරුදු 21 ක තරුණයෙක්. ඔහු තම පියාට අයිති කුඹුරු අක්කර 13 ක් වැඩ කරනවා. මෙයින් අක්කර 5 කට ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ ජලය ලැබෙන අතර, අක්කර 8 කට සුළු වාරිමාර්ග ක්‍රම යටතේ ජලය ලැබෙනවා. අක්කර 2 ක ගොඩ ඉඩම් ඔහුට තිබෙනවා. මේ තරුණයාටත් ප්‍රශ්නයක්ව ඇත්තේ වතුරයි. වී, මිරිස්, ලූනු හැරෙන්නට ඔහු උළුඳුත් වගා කරනවා.

ඔහුගේ පළාතේ ගොවි කාරක සභාව ඔහුගේ අදහසේ හැටියට එතරම් පලක් ඇති සංවිධානයක් නෙමෙයි. වාරිමාර්ග ඇලවල් පිරිසිදු කිරීම ගැන ගොවි කාරක සභාව හොඳින් සොයා බලන්නේ නැහැ. ඒ වගේම ඒ සාමාජිකයින්ගෙන් ගොවිතැනට එතරම් උදව්වක් ලැබෙන්නේ නෑ. අලුතින් සාමාජිකයින් තෝරා ගන්නා තෙක් මේ තත්වය උහුලගෙන ඉන්නවා හැරෙන්නට වෙන කළයුතු දෙයක් නැහැ.

තමන් ද සමුපකාර සංගමයෙන් ණය මුදලක් ගත් බවත්, එයින් රු. 500/-ක් පමණ තවත් ගෙවීමට ඇති බවත්, පොලියද ඇතුළුව දූන් එය රු. 800/-ක් වී ඇති බවත් දේවදසන් මහතා ප්‍රකාශ කළා. මෙම ණය මුදල ආපසු ගෙවීමට නොහැකි වූයේ, විශේෂයෙන් යල කන්නයේදී බෝග වගාව හරියාකාරව කර ගැනීමට බැරි වූ නිසයි. හදිසි අවස්ථා යටතේ ණය මුදලක් දෙන බවට පොරොන්දු වී ඇතත් එය තවම ලැබී නැහැ. ඉඩම පිළියෙල කිරීමට එහෙයින් දූන් කිසිම මාර්ගයක් නැහැ.

තමා ගොවිතැනට තද ආශාවක් දක්වන බව තරයේම කියා සිටි දේවදසන් මහතා මාසයකට රු. 250/-ක් ලැබෙන ආණ්ඩුවේ රක්ෂාවක් ගැනීමට ගොවිතැන අත් නොහරින බව ප්‍රකාශ කළා. තම පියා ගොවිතැන සඳහා යෙදවූ ක්‍රම කෙසේ දියුණු කළේදැයි අප ඇසූ ප්‍රශ්නයට ඔහු දුන් පිළිතුර වූයේ වැඩි අස්වැන්නක් ගෙන දෙන බීජ සහ දියුණු කාර්මික ශිල්ප තමන් උපයෝගී කර ගත් බවයි. ඔහු නොකඩවා කෘෂිකර්ම ව්‍යාප්ති සේවක සහ කෘෂිකර්ම උපදේශක හමු වී උපදෙස් ලබා ගත් අතර, ව්‍යාප්ති අංශයෙන් මුද්‍රණය කරන ලද සෑම පත්‍රිකාවක්ම වාගේ කියවා තිබෙනවා. ගොවිපලක් හොඳින් පාලනය කරන්නේ කෙසේදැයි දැන ගැනීමට ඔහු උනන්දුවක් දක්වන අතර වඩ වඩාත් ලාබ ලබා ගැනීමට කවුරුන් හෝ උපදෙස් දෙන්නේ නම් ඊට මුදලක් ගෙවීමට පවා දේවදසන් මහතා සූදනම්ය.

ගුවන්විදුලි වැඩ සටහන්වලට කන් දීමට ඔහු කැමතියි. එහෙත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩ සටහන් බොහෝ දුරට සාමාන්‍ය තත්වයේ වැඩ සටහන් බව ඔහු පැවසුවා. ගොවීන් තමන්ගේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන වැඩ සටහන් ඇතුළත් දකුණු ඉන්දියානු ගුවන් විදුලි ප්‍රචාරවලට කන් දීමට ඔහු වැඩි කැමැත්තක් දක්වනවා.

දේවදසන් මහතා පවසන හැටියට ඒ ප්‍රදේශයේ විනෝදාංශ කිසිවක් නැහැ. ළඟම තිබෙන සිනමා ශාලාවත් හැතැප්ම 22 ක් පමණ ඈතයි. ඒ පළාතේ ගොවිතැන් කිරීමට තරුණයින් වැඩි කැමැත්තක් නොදක්වන්නේ විනෝද පහසුකම් ආදිය නැති නිසයි.

ඔවුන්ගේ මුළු ඉඩමෙන් අවුරුද්දකට රු. 2000/-ක විතර ආදායමක් ලැබෙනවා. තමා සාමාන්‍ය ගොවියෙක් හැටියට සැළකිය හැකි බව දේවදසන් මහතා ප්‍රකාශ කළා. ඔහුගේ කතා පුවත අවසාන කරමින් දේවදසන් මහතා පැවසුවේ ක්‍රමානුකූලව වතුරත්, ගොවිපලේ මූලික වියදම් පියවීමට ප්‍රමාණවත් මුදලකුත් ලබා දෙන්නේ නම් සියළුම ණය මුදල් ආපසු ගෙවා ලාබයක් ද ලබා ගැනීමට හැකි පරිදි ගොවිතැන් කළ හැකි බවයි.

× × × ×

වෙට්ටිකුලම්හි මුදලියාර්කුලම්හි ජේ. පතිනාදන් මහතාගේ වයස අවුරුදු 23 යි. ඔහු තම පියා සමග එක්ව ගොවිපලේ වැඩ කරල තියෙනව. සුළු වාරිමාර්ග ක්‍රමය යටතේ කුඹුරු අක්කර 16 කුත්, ගොඩ ඉඩම් අක්කරයකුත් ඔවුනට තිබෙනවා. තමා අ.පො.ස. තෙක් ඉගෙන ගත් බව පැහැදිලි කළ පතිනාදන් මහතා පාසැල් යන දවස්වල සිටම ගොවිතැන ප්‍රිය කළ බව අප සමඟ පැවසුවා. ඔහු සිය ගොවිපලේ දියුණු බෝග වර්ග, දියුණු ශිල්ප ක්‍රම, කෘෂි රසායනික ද්‍රව්‍ය සහ පෝර යනාදිය පාවිච්චි-



වෙන මොනම රක්ෂාවකටවත් ගෙවත්තෙන අත් නොහ-රින බවට ජේ. පතිනාදන් මහතාට සහ බිරිඳට හොඳට විශ්වාසය.

යට ගත්තත් ඔහුගේ ප්‍රශ්නය වූයේ වතුර නැති කම සහ කලට වේලාවට මුදල් නොලැබීමයි.



වාරිමාර්ග වැව් පිළිවෙලකට අළුත්වැඩියා කර නැති බව වාරිමාර්ග නියෝජිත පී. පාවුලුපිල්ලේ මහතා පවසයි

මේ කරුණු දෙක ඉෂ්ට කර දෙන්නේ නම් ගොවියන්ගේ තත්වය මීට වඩා වෙනස් වන බව ඔහුගේ අදහසයි.



මුදලියාර්කුලම් වැව සම්පූර්ණයෙන්ම වාගේ සිඳී ගොස් ඇත. ඇත කෙළවරේ පමණක් වතුර ඉතාමත් ස්වල්පයක් තිබේ. ඔක්තෝබර් මස මුල් භාගයේ වැස්ස ඒමට පෙර වියළි කළාපයේ සෑම වැවක්ම පාහේ පෙනුනේ මේ විදියටයි.

පතිනාදන් මහතා කිසිම දයාවක් නැතිව ඔවුන්ගේ ගොවි කාරක සභාව විවේචනයට ලක් කළා. එමෙන්ම වැඩ කිසිවක් ගොවි කාරක සභාව සොයා නොබලන බව ඔහු ප්‍රකාශ කළා. ඇලවල් පිරිසිදු කිරීමට ගොවි කාරක සභාව විසින් යොදවා ඇති වාරිමාර්ග ඒජන්තවරුන්ට අවුරුදු ගණනාවක්ම සල්ලි ගෙවා නැහැ. ඒ නිසා ඔවුන් එම වැඩය කෙරෙහි සැළකිල්ලක් දක්වන්නේ නැහැ. අන්තිමේදී මේ සියළු දේටම වගකීමට සිදු වන්නේ ගොවියාටයි.

ඒ වගේම සමූපකාර සංගමයේ වැඩ කටයුතු අසතුටුදායකයි. පතිනාදන් මහතා පවසන අන්දමට ඔවුන්ට අවශ්‍ය වන වේලාවල්වලට පෝර, කෘෂි රසායනික ද්‍රව්‍ය සහ වෙනත් අවශ්‍යතාවයන් ලැබෙන්නේ නැහැ.

බණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් නිෂ්පාදනය කරන කෘෂි රසායනික ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නයද පතිනාදන් මහතා සඳහන් කළා. මෙම කෘෂි රසායනික ද්‍රව්‍ය පිළිබඳව ගොවියන් වැඩි දුර නොදන්නා නිසාත්, ඒවා පාවිච්චි කර හොඳ නරක බලා නැති නිසාත්, එම කෘෂි රසායනික ද්‍රව්‍ය පාවිච්චියට ගැනීමට ඔවුන් අකමැතියි. එහෙත් බලයෙන්ම වාගේ ඒවා ඔවුන් මත පටවන හෙයින් වෙන කළහැකි දෙයක් නැති බව ඔහු කීවා. මෙම කෘෂි රසායනික ද්‍රව්‍ය පාවිච්චි කිරීමට ගොවීන් හුඟ දෙනෙක් අකමැති නිසා මේවා විශාල වශයෙන් සමූපකාර සංගමයේ ගොඩ ගැසී තිබෙනවා.

ස්වභාව ධර්මය පාලනය කිරීමට නොහැකි බව පිළිගත් පතිනාදන් මහතා පැවසුවේ ගොවීන්ගේ තත්වය දියුණු කිරීමට කළයුතු වැඩ බොහෝ ඇති බවයි. වේලි කැඩී බිඳී ඇති සින්නකුලම්, සිලූවායිකුලම්, පාර්පුලියම්කුලම් වැනි වැව් ගණනාවක් තියෙනවා. මෙම වැව් අළුත් වැඩියා කළොත් ජලය ඇති තරම් ලබා ගන්නට පුළුවන්. මෙම කාරණය කීප වාරයක්ම ගොවි කාරක සභාවට දැන්වූවත් ඔවුන්ගේ පිළිතුර වූයේ ඒ බව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට දන්වා ඇති බවයි. මොනව වුනත් කිසිම දෙයක් ඉටු වෙලා නැති නිසා ගොවියා ඉන්නේ ඔහුගේ පැරණි තත්වයේමයි.

පසුගිය අවුරුද්දේ තුට්ටුවගායිකුලම් නමැති වැව කැඩී ගියා. අපට හමුවුන වාරිමාර්ග ඒජන්ත පී. පාවුලුපිල්ලේ මහතා කීවේ වැව අළුත්වැඩියා කිරීමට කටයුතු කර නැති බවයි. බොහෝවිට වැව අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව ලැබෙන්නේ වාරිමාර්ග පරිපාලකටයි. ඔහු එය කිසිම සැළකිල්ලක් ඇතිව ඉෂ්ට කරන්නේ නැහැ. වැව් හොඳින් අළුත්වැඩියා කළොත් යල, මහ කන්න දෙකම වැඩ කිරීමට ඕනෑතරම් වතුර ලැබෙන බව පාවුලුපිල්ලේ මහතාගේ ස්ථිර විශ්වාසයයි.

× × × ×




ම හ නු ව ර, උඩ පේරාදෙණිය ගඟවත්ත කෝරළේ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රමයේ කළමනාකරු කේ. ඒ. වික්ටර් පෙරේරා මහතා අපට හමු වුනා. මෙම ගොවිපල අක්කර 350 ක පරණ තේ වත්තක්. මෙයින් අක්කර 50 ක් එළි පෙහෙළි කර ඇති අතර, ඉතිරි හරියද එසේ එළි පෙහෙළි කරගෙන යනවා. එළවළු සහ කුරක්කන්, මයියොක්කා, ඉරිඟු ආදී බෝග ගණනාවක් මෙහි වවා තියෙනවා. මෙම ගොවිපලේ තරුණයින් 25 දෙනෙක් පමණ. දිනපතා වැටුප් ලබන පළපුරුදු ගොවීන් 35 ක් හෝ 40 ක් යටතේ ආධුනිකයින් ලෙස කටයුතු කරනවා. ගොවිතැන පිළිබඳව මෙම තරුණයින් ඉගෙන ගත්තාට පසුව ගොවිතැනේ පාලනය ඔවුන් භාර ගන්නා අතර පුහුණුව දුන් ගොවීන්ට ඔවුන් කැමති නම් වත්තේ ඉතිරි කොටසින් ඉඩම් කොටසක් ලබා ගැනීමට පුළුවන්.

මෙම යෝජනා ක්‍රමය පිළිබඳව විස්තර සහිතව කථා කළ පෙරේරා මහතා මෙම යෝජනා ක්‍රමයේ පරමාර්ථ මෙසේ සඳහන් කළා.

1. අහල පහල ප්‍රදේශවල තරුණයින්ට කෘෂි කර්මාන්තයේ රක්ෂාවල් සපයා දීම.



සමූහ ගොවිපළෙහි තරුණ ගොවියෝ පළපුරුදු ගොවීන්ගේ මෙහෙයවීම යටතේ වැඩ කරති.

2. සාධාරණ මිළකට අසල්වැසි ගම්වලට පැල ආදිය සපයන සේවා මධ්‍යස්ථානයක් ඇති කිරීම.
3. වඩා විද්‍යාත්මක ලෙස ගොවිතැන් කර පලදාව වැඩි කිරීමට ගොවීන් ධෛර්‍යමත් කරන ආදර්ශ ගොවිපලක් ලෙසත් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙසත් කටයුතු කිරීම.

විවිධ සේවා සමුපකාර සංගමය, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලය ආදී විවිධ සංවිධානවල සාමාජිකයින්ගෙන් සමන්විත මණ්ඩලයක් වෙත මෙම ගොවිපලේ පාලනය පවරා ඇති බව පෙරේරා මහතා පැහැදිලි කළා. උපදිසාපති සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් ද එහි සාමාජිකයෝය. මෙම මණ්ඩලය තීරණවලට එළඹෙන්නේ ප්‍රතිපත්ති පිළිබඳ වූ පුළුල් කරුණු ගැනයි. එදිනෙදා ගොවිකටයුතු වැඩ සම්පූර්ණයෙන්ම එම සමුපකාර ගොවිපලේ සාමාජිකයින්ට පැවරී තිබුණි. එම ගොවිපලට අවශ්‍ය මූල ධනය විවිධ සේවා සමුපකාර සංගමයෙන් අත්තිකාරමක් හැටියට ලබාදී තියෙනවා.

අසල්වැසි ගම්වාසීන් සමඟ හොඳ සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට සෑම උත්සාහයක්ම දරනවා. මෙය කරනු ලබන්නේ ගොවිපලේ නිෂ්පාදනය කරන දේවල් සාධාරණ මිළකට ගම්වැසියන්ට විකිණීමෙන් සහ ඔවුන්ගේ සමාජයීය කටයුතුවලට සහභාගිවීමෙන්.

අවසාන වශයෙන් සතුන් ඇති කරන ගොවිපලක් ඇති කිරීමට ඔවුන් බලාපොරොත්තු වන බව පෙරේරා මහතා අපට පැවසුවා.

කෙසේ වෙතත් මූලික ප්‍රශ්න ගණනාවක් තියෙනවා. ගොවිපලේ වැඩ කරන අය ගොවිපලේම පදිංචි වී නැති නිසා සමහර අයට ඉතාමත් දුර ප්‍රදේශවල සිට ගමන් කිරීමට සිදුවී තියෙනවා. ගොවිපල ඇතුළත භෝජනාගාර පහසුකම් නැහැ. ඒ වගේම දවසකට ඔවුනට ලැබෙන රු. 4/- ක වැටුප වියදම පියවා ගැනීමට මදි බව ඔවුන් සළකනවා.

කෙසේ වෙතත් මෙම ගොවිපල සාර්ථක වන බවට පෙරේරා මහතාට විශ්වාසය. දැනටමත් ගොවිපලේ උපයෝගී කරගෙන ඇති අලුත් ශිල්ප ක්‍රම ආදිය අසල්වැසි ගොවීන් කිහිප දෙනෙක්ම අනුගමනය කරනවා.

× × × ×

ගෙලිඔය පෙතියගොඩ ඩී. ආර්. රම්බණ්ඩා මහතාගේ වයස අවුරුදු 28 යි. රම්බණ්ඩා මහතාගේ පවුලට කුඹුරු අක්කර දෙකකුත්, තේ, පොල්, පලතුරු සහ එළවළු ආදී නොයෙකුත් භෝග වගා කරන එක අක්කරයකුත් තියෙනවා. මෙම ඉඩමේ ඔහු වැඩ කරන අතර එහි නිෂ්පාදනය කරන දේවල්වලින් කොටසක් ඔහු පවුලේ අනිකුත් සාමාජිකයින්ට දෙනවා. ගොවිතැනින් ඔහුට ලැබෙන ආදායම ප්‍රමාණවත් නිසා එයින් ලාභ ගැනීමේ ඕනෑ කමක් නැහැ.

ජලය පිළිබඳව ප්‍රශ්නය ඔහුට එතරම් බැරෑරුම් නැහැ. රු. 50/- ක් විතර වියදම් කර ඔහු ළිඳක් කපාගෙන තියෙනව.

රම්බණ්ඩා මහතා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට එළවළු සපයන්නෙක්. ඔහු අසල්වැසි ගොවීන්ගෙන් එළවළු ලබාගෙන, ඉතාමත් සුළු ලාභයක් තමන් තියාගෙන ඒ එළවළු අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට විකුණනවා. මෙය ඔහුගේ අතිරේක ආදායම් මාර්ගයක්.

ඔහුගේ ප්‍රදේශයේ ගොවීන් බොහෝ දෙනෙක් අඳ ගොවීන් නිසා ඒ අයගේ තත්වය එතරම් සාර්ථක නැහැ. ඉඩම් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵල ඒ ප්‍රදේශයට තවම දැනී නැහැ. ප්‍රදේශයේ සියළුම ගොවීන්ට පාහේ ණය මුදල් පිළිබඳ ප්‍රශ්නය බැරෑරුම් ප්‍රශ්නයක්.

රම්බණ්ඩා මහතා පැවසුවේ බාල වයසේ සිටම ගොවිතැන තමන්ගේ සිත් ඇදගත් බවයි. පාසැල් ශිෂ්‍යයෙක් හැටියට ඔහු එළවළු පාත්ති



වතුර සැපයීම ක්‍රමානුකූල වුවහොත් කුඹුරෙන් වැඩි ආදායමක් ලබා ගත හැකි බව රන්බණ්ඩා මහතා පැහැදිලි කරයි.

හදල මාසයකට රු. 30/-ක විතර ආදායමක් ලබා ගත්තා. මෙයින් උද්‍යෝගයට පත්වුනු රම්බණ්ඩා මහතා ගොවියෙකු වශයෙන් කටයුතු කිරීමට ධෛර්‍යමත් වුනා. ඔහු කිසිදක වෙන රක්ෂාවක් කරලා නැහැ. කරන්න ආශාවක් දක්වන්නෙත් නැහැ. ගොවිතැන නිදහස් රක්ෂාවක් නිසා ඔහු එයට කැමතියි.

ගොවි කාරක සභාව හොඳින් වැඩ කරන බව රම්බණ්ඩා මහතා පැවසුවා. ඔහු පවසන විදියට ඇලවල් ශුද්ධ කිරීම, ජලය බෙදා හැරීම ආදී ඒ කාරක සභාවට අයිති වැඩ කටයුතු හොඳින් කෙරෙනවා.

ගුවන් විදුලියේ ගොවි වැඩ සටහන් බොහෝ ප්‍රයෝජනවත් බව ඔහුගේ අදහසයි. කෙසේ වෙතත් වඩ වඩාත් මෙම වැඩ සටහන්වලට ගොවීන් සහභාගී කරවා ගැනීම කළයුතු දෙයක්. එක් අවධියක ඔහු තරුණ ගොවි සමාජයේ ලේකම් හැටියට වැඩ කළා. පළාතේ සමහර මිනිසුන් ඔවුන් ත්‍රස්තවාදීන් හැටියට හංවඩු ගැසූ නිසා තරුණ ගොවි සමාජය අහෝසි වුනා.

සාමාන්‍ය ආදායමක් ලබන සාමාන්‍ය ගොවි-යෙකු හැටියට රම්බණ්ඩා මහතා තමාව හඳුන්වා දුන්නා. ජලය සැපයීම ක්‍රමානුකූලව කරන්නේ නම් ගොවිතැනින් මීට වඩා ලාභ ලබා ගත හැකි බව ඔහුගේ අදහසයි.

ඔහුගේ සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 40 යි. පෝර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය ලබා ගැනීම ඔහුට ගැටළුවක් නොවෙයි.

සහල් සලාකය අඩු කිරීම නිසා සෑම කෙනෙක්ම තමන්ගේ ගොවිතැන් කටයුතු වැඩි දියුණු කිරීමට උත්සාහ කරනු ඇතැයි රම්බණ්ඩා මහතා අවසාන වශයෙන් කියා සිටියා. ඔහුගේ අදහසේ හැටියට සහල් සලාකය අඩු කිරීම නිසා ටික කලක් යන තෙක් කරදර විඳ ගැනීමට සිදු වෙනවා.

× × × ×

හන්දෙස්ස හියාරාපිටියේ බී. එම්. ගුණරත්න මහතා වයස අවුරුදු 37 ක ගොවියෙක්. ඔහු කුඹුරු අක්කර $1\frac{1}{2}$ ක අඳ ගොවියෙක් ලෙස වැඩ කරන අතර තමන්ගේ පවුලට අයත් ගොඩ ඉඩම් අක්කර 2 ක ද ඔහු වැඩ කරනවා. ඔහුගේ ගොඩ ඉඩම්වල ඔහු මයියොක්කා වගා කර ඇති අතර තම ගෙවත්තේ නොයෙකුත් බෝග වර්ග වගා කර හරක් කිහිප දෙනෙකුත් ඇති කර තිබෙනවා. ගුණරත්න මහතාටත් ජලය ප්‍රශ්නයක්ව පවතින අතර වැසි වතුරෙන් ඔහු සිය ගොවිතැන් කරනවා.

ඔහු පැවසුවේ ගොවි කාරක සභාව සතුටුදායක ලෙස වැඩ කරන බවයි. පෝර, කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ ඔහුගේ බෝග අලෙවි

කිරීම පිළිබඳව ඔහුට එතරම් ප්‍රශ්නයක් නැහැ. කෙසේ වෙතත් පිට පිටම කන්න කිහිපයක්



උස්බිම් පෙදෙස පෙන්වන පී. ඩබ්ලිව්. ගුණරත්න මහතා එවැනි තැන්වලට වතුර ගැනීම ලොකුම ප්‍රශ්නයක් බව පවසයි.

හොඳින් වැඩ කර ගැනීමට ඔහුට නොහැකි වූ නිසා සිය ණය මුදල ආපසු ගෙවීමට බැරි වුනා. ඒ නිසා තවත් ණය මුදලක් ලබා ගැනීමට ඔහුට හිමිකම් නැහැ.

අතිරේක ආදායම් මාර්ගයක් වශයෙන් ගුණරත්න මහතා වෙනත් අයගේ ගොවි පලවල්-වල වැඩ කර කුලියක් ලබා ගන්නවා.

ඔහුට ඇති එක් ගැටළුවක් නම් තම වත්තේ උස් බිම් කොටසට වතුර ලබා ගැනීමයි. මේ සඳහා පොම්පයක් පාවිච්චි කිරීමට හැකියාවක් තිබෙනවා නම් එම ප්‍රශ්නය විසඳා ගන්න ඔහුට පුළුවන්.

× × × ×

හන්දෙස්ස හියාරාපිටියේ බී.ජී.උක්කුබණ්ඩා මහතාගේ වයස අවුරුදු 72 යි. ඔහු සමඟ සිටින අවුරුදු 22 ක් වයසැති එක පිරිමි ළමයෙක් හැරෙන්නට ඔහුගේ අනික් දරුවන් විවාහ වෙලා වෙනත් තැන්වල රක්ෂාවල් කරන බව ඔහු ප්‍රකාශ කළා. ගොවියෙක් වශයෙන් ඔහු ලබා ඇති අත්දැකීම් පිළිබඳව දැන ගැනීමේ අදහසින් මෙන්ම එම ප්‍රදේශයේ ගොවියන්ගේ ජීවන තත්වය දියුණු කිරීමට ඔහුට ඉදිරිපත් කළහැකි යෝජනා පිළිබඳව දැන ගැනීමේ අදහසින් ද අප උක්කු බණ්ඩා මහතා සමඟ කතා කළා.

ඒ ප්‍රදේශයේ ගොවියෝ වැසි වතුර පමණක් උපයෝගී කරගෙන ගොවිතැන් කරන බව උක්කු බණ්ඩා මහතා පැහැදිලි කළා. ළිං තැනීමෙන් ජලය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගත නොහැකි බව උක්කුබණ්ඩා මහතා කීවා. මුළු ප්‍රදේශයෙහිම වතුර පිළිබඳ ප්‍රශ්නය විසඳා ගැනීමට ඔහු පැවසූ එකම මාර්ගය නම් අමුණක් සෑදීමයි.

මුළු ප්‍රදේශය පුරාම අද ගොවි ක්‍රමය තියෙනවා. ණය මුදල් ඔවුනට ලොකුම ප්‍රශ්නයක්. ඉඩම් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵල එම ප්‍රදේශයට තවම දැනී නැහැ. උක්කුබණ්ඩා මහතා කීවේ සුළු මුදලක් ණයට අරගෙන ඒ ණය මුදල ආපසු ගෙවීමට පුරුද්දක්ව සිටින පැරණි කට්ටියට තමන් අයිති බවයි.



අවුරුදු 72 ක් වයස බී. ජී. උක්කුබණ්ඩා මහතා ගොවි කටයුතු වල හොඳ පළපුරුද්දක් ලැබූවෙකි. ඔහුගේ පුතා බී. ජී. රණවිජේරත්න මහතා තමා පිළියෙල කර ගත් පින්තූරයක් පෙන්වයි.


ණය නොගෙවා පැහැර හරින්නන් බොහෝ දෙනෙක් සිටීම පුදුමයක් නොවන බව ඔහු

ප්‍රකාශ කළා. ගොවියාට මුදල් ඕනෑ කරන වේලාවලටම මුදල් ණයට දෙන මිනිසුන් ගොවියා ළඟට එනවා. ඒ වගේම අස්වැන්න ගන්න කාලෙට නොවරදවාම ණය හිමියා තමාගේ ණය මුදල ආපසු ලබා ගැනීමට ගොවි-යාගේ නිවසටම පැමිණෙනවා. සමුපකාර සං-ගමය ණය මුදල් පිළිබඳව හොඳින් සොයා බලා ණය මුදල් ආපසු ලබා ගැනීමේ හොඳ වැඩ පිළිවෙලක් පිළියෙලකර නැහැ. කෙසේ වෙතත් සාමාන්‍යයෙන් ගොවීන්ගේ ජීවිත තත්වය එතරම් සතුටුදයක නැති නිසා පෞද්ගලික ණය හිමියන්ගේ ණය මුදල් ගෙවීමෙන් පසුව ආණ්ඩු-වෙන් දුන්න ණය මුදල් ආපසු ගැනීමට තරම් මුදලක් ඔවුන් අත ඉතිරි වන්නේ නැහැ. සමුපකාර සමිතියක් හෝ ඕනෑම ණය දෙන සමාගමක් හොඳ වැඩ පිළිවෙලක් ඇතිව ණය දෙන ක්‍රමයක් ඇති කළොත් මේ තත්වය දියුණු වන බව උක්කුබණ්ඩා මහතාගේ විශ්වාසයයි.

තමාගේ ප්‍රදේශයේ අක්කරයක සාමාන්‍ය අස්වැන්න වී බුසල් 50 ක් බව පැහැදිලි කළ උක්කුබණ්ඩා මහතා මේ සඳහා වැය වන මුදල රු. 600/-ක් පමණ වන බව කීවා. සියළුම තරුණයින් ගොවිතැනට බැසීම බලාපොරොත්තු නොවිය යුතු බව ඔහුගේ අදහසයි. අවුරුදු 22 ක් වයස ඇති ඔහුගේ පුතා කලාවට ආශාවක් දක්වන කෙනෙක්. ඔහු ගොවිතැන කෙරෙහි එතරම් සැළකිල්ලක් දක්වන්නේ නැහැ. මේ තරුණයා උණ ලී පතුරුවලින් පිංතූර කිහිපයක් පිළියෙල කර තිබෙනවා. එහෙත් ඒවා විකුණා ගැනීමට තැනක් ඔහුට ලැබී නැහැ. උක්කු බණ්ඩා මහතා පැවසුවේ මේ වගේ කලාවට නැමුනු වැඩවලට සහ වෙනත් කලාත්මක වැඩ වලට හපන්කම් ඇති තරුණයින් ගමේ සිටින බවයි. ඔවුන් ධෛර්‍යමත් කිරීමට අවස්ථා සැළසිය යුතුයි. ඒ සියළුදෙනාම ගොවිතැනට බැසිය යුතු යයි බල කිරීම ඒ අයගේ ජීවිතයේ ආශාවන් මරා දැමීමක් වෙනවා.

× × × ×

මැණික්දිවෙල එපිලාදෙන එම්. බී. දිසා-නායක මහතා අවුරුදු 55 ක් වයස ගොවියෙක්. ඔහුට දරුවන් 6 දෙනෙක් සිටින අතර ඒ සියළු දෙනාම ඔහුගේ ගොවි කටයුතුවලට උදව් වෙනවා. ඔහුට කුඹුරු අක්කර 4 කුත්, ගොඩ ඉඩම් අක්කර 3 කුත් අයිතිව තිබෙනවා. ඊට අමතරව අඳ ගොවියෙක් හැටියටත් කුඹුරු අක්කර $2\frac{1}{2}$ ක් ඔහු වැඩ කරනවා. දිසානායක මහතා ජලය පිළිබඳ ප්‍රශ්නය ගැන පැමිණිලි



එම්. බී. දිසානායක මහතා සමග සාකච්ඡාවක්—මී හරක් නැතිකම ඔවුන්ගේ ලොකුම ප්‍රශ්නයක් බව ඔහු පැහැදිලි කරයි.

කළා. ඔහු අවට ජීවත්වන සියළුම ගොවීන් අඳ ගොවියන් වන අතර ඔවුනට ණය මුදල් ඉතාමත් අවශ්‍යයි.

කුඹුරු හෑම සඳහා මී හරක් නැතිකම තදබල ප්‍රශ්නයක්. එක් ගොවියෙක් තමන්ගේ කුඹුරු හාල ඉවර වෙනකල් මී හරකුන් ලබා ගන්න අනික් ගොවියාට බලා සිටීමට සිදු වෙනවා. මේ හේතු කොටගෙන ගොවිතැනට බාධ පැමි-ණෙන අතර සමහරවිට වී වැපිරීමටත් ප්‍රමාද වෙනවා. අත් ට්‍රැක්ටරයකින් හෑම පහසු වුවත් එය මුදල් වැය වන වැඩක්.

දිසානායක මහතා ගොවි කාරක සභාවේ ලේකම් කෙනෙක්. එහෙත් අපක්ෂපාතව කථා කරමින් ඔහු කීවේ එය හොඳින් ක්‍රියාත්මක වන බවයි.

ඒ පළාතේ ගොවීන් අතර ඇති තවත් ප්‍රශ්නයක් නම් උදළු හිඟ කමයි. සමුපකාරය හොඳින් වැඩ කරන්නේ නැති නිසා බරපතල අඩුපාඩු හුඟක් තියෙනවා. පෝර ගෝනි ප්‍රවේශමක් නැතිව පරිහරනය කිරීම නිසා ඒවායින් හුඟක් අඩුපාඩුකම් සිද්ද වෙනවා. පොහොර සම්බන්ධයෙන් තවත් ප්‍රශ්නයක් වුනේ, යූරියා පොහොර පැක් කරලා තියෙන්නේ හොණ්ඩරය සහ හොණ්ඩර $\frac{1}{2}$ ගෝනිවලයි. මේ හේතුවෙන් සුළු ප්‍රමාණයක් යූරියා පෝර අවශ්‍ය ගොවීන්ට එය සමුපකාර සමිතියෙන් සිල්ලරට ලබා ගැනීමට හැකියාවක් නැහැ. ඇත්තෙන්ම යූරියා පෝර තමන්ගේ තවාන් වලට යෙදීම සඳහා අවශ්‍ය වන්නේ ඉතාමත් සුළු වශයෙන්. මේ පෝර රාත්තල් හතේ, දහතරේ, විසි එකේ බෑග්වල දමා තියෙනවා නම් එය හුඟාක් ප්‍රයෝජනවත්.

සමුපකාරයේ නිලධාරීන් ද ඉවක් බවක් නැතිව වැඩ කරන කිසිම උදව්වක් නොදෙන පුද්ගලයින් හැටියට දිසානායක මහතා හඳුන්වා දුන්නා. ගොවීන් දෙන වී ගබඩා කරන්න තැනක් නැහැයි කියා සමුපකාර සමිතිය ගොවීන් බොහෝ දෙනෙකුගේ වී භාර ගත්තේ නැහැ. මැණික්දිවෙල, යටිගම්මන, තිස්මඩ ආදි තැන්වල සමුපකාර සමිති මේ විදියට ගොවීන්ගේ වී ලබා ගැනීමට අකමැති වුනා. මේ තත්වය තියෙනවා නම් සෑම අතින්ම අසිරුකම්වලට මුහුණ දෙන ගොවීන්ට නිෂ්පාදනය වැඩි කරන ලෙස කීමෙන් පලක් නොවන බව දිසානායක මහතා පැහැදිලි කළා. ගොවීන්ගේ මේ තත්වයෙන් පෞද්ගලික වෙළෙන්ද හොඳට ප්‍රයෝජන ගන්නා බව පැවසූ දිසානායක මහතා මේ නිසාම වැඩිම වාසි අයත් වන්නේ පෞද්ගලික වෙළෙන්දට බවද කීවා.

එපිලාදෙන වැව හන්දියේ පැරණි වැවක් ප්‍රදේශයෙහි ඉංජිනේරු අංශය විසින් අළුත්වැඩියා කරගෙන යන බව දිසානායක මහතා ප්‍රකාශ කළා. මෙම වැවේ වැඩ කටයුතු ඉවර වුනාට පස්සේ ඒ ප්‍රදේශයේ ගොවීන් හුඟ දෙනෙකුට එයින් ප්‍රයෝජනයක් ලැබේවි.

ඉසින යන්ත්‍ර නැති කමත් ප්‍රශ්නයක්. ගොවි කාරක සභාවට මේ යන්ත්‍ර දෙකක් තිබුණත්, එකක් කැඩිලා. සමුපකාරයට එකක්වත් නැහැ. සෑම අක්කර 250 කටම ඉසින යන්ත්‍ර පහක් හෝ හයක් තිබිය යුතු බව දිසානායක මහතාගේ අදහසයි. මෙම ඉසින යන්ත්‍ර කුලියට ගැනීමට ගොවීන් තද කැමැත්තක් දක්වනවා ඇති.

සහල් සලාකය අඩු කිරීම ඇත්ත වශයෙන්ම නිෂ්පාදනය වැඩි කිරීමට පෙළඹවීමක්. ඒ වුනත් ගොවීන් ළඟ තිබෙන සහල් ප්‍රමාණය ටික නිසා ටික කලක් යන තෙක් ගොවීන්ට අමාරුකම්වලට මුහුණ දෙන්නට සිද්ද වෙනවා.

උදළු ලබා ගැනීමට ඇති දුෂ්කරතාවයට අමතරව කිව යුත්තේ මෙරට හද ඇති උදළු සතුටුදයක නැති බවයි. එක් අතකින් ඒවා බර වැඩි යි. අනෙක් අතට තලය පළල් වැඩියි. මේ නිසා උදැල්ලෙන් කොටන කොට වැඩි මහන්සියක් යෙදවීමට සිද්ද වෙනවා. උදළු ගැන කථා කරන කොට එතන හිටිය එක් ගොවියෙක් මේ උදළු දෙකේ වෙනස පෙන්වන්න උදළු අරන් ආවා. (පිංතූරය බලන්න) ඔහු පෙන්වා දුන්නේ ඔහුගේ දකුණු අතේ ඇති උදැල්ල හුඟක් බර නිසා එය සුදුසු නැති බවයි. මෙම උදළු සෑදීමට පිළියෙල කළ පුද්ගලයා කවදකවත් කුඹුරකට ගොස් ඇති කෙනෙක්දැයි ඔහු ප්‍රශ්න කළා.



ගොවියෙක් උදලු පිළිබඳව කාරණයක් පැහැදිලි කරයි. ඔහුගේ වම් අතේ ඇති උදැල්ල බර, ප්‍රමාණය සහ හැඩය අතින් හොඳය. ඔහුගේ දකුණු අතේ ඇති උදැල්ල එතරම් හොඳ නැත.

දිසානායක මහතා සමඟ අප කතා කරද්දී අප වටා රැස් වුනු ගොවීන් 8 දෙනා හෝ 10 දෙනා (මුල් පිටුවේ පිංතූරය) එකඟ වුනේ, ගොවිතැන හොඳ ජීවන මාර්ගයක් යනුවෙනුයි. ව්‍යාප්ති දෙපාර්තමේන්තුව හොඳ වැඩ කොටසක් ඉටු කර ඇති අතර, අවස්ථාවට අනුව කළ යුත්තේ මොකක්ද කියා ඒ නිලධාරීන් දන්නා බව ඔවුන් පැහැදිලි කළා. එහෙත් සැපයීම හා සේවාවන් භාර නිලධාරීන් වැඩි සැළකිල්ලක් දක්වන්නේ නැති බව ඔවුන්ගේ මතයයි. මේ උදාසීන කම නිසා ගොවිතැන් කිරීමට ගන්නා උත්සාහයට බාධා පැමිණෙන බව මේ ගොවීන් අදහස් කළා.

× × × ×

වරින් වර ගොවිමහතුන් දස දෙනෙක් පමණ මුණගැසී, ගොවිතැනින් ඒ අය ලබා ඇති අත්දැකීම් ''ගොවි ජනතාව'' සඟරාවේ පසුව නිකුත්

25 වැනි පිටුව බලන්න